# අස්වනු පුද සිරිත්

(මහාචාර්ය ඇම්. එච්. ගුණතිලක විසිනි)

සිංහල වුවද, ද්‍රවිඩ වුවද, පාරම්පරික සිරිත් විරිත් පරිස්සමින් ආරක්‍ෂා කරගෙන සිටින පිරිසක් තවම දිවයිනෙහි සිටිති. නාගරිකයේ වසන මෝටර් රියදුරා සුක්කානම වෙත වාඩිවී ඇන්ජිම ක්‍රියාත්මක කරවන්නේ සුක්කානමට නැමුරුවී තෙවරක් නමස්කාර කිරීමෙනි. වෙනකක් තබා කවර පලානක වුව, රා මදින්නා පවා, අතුරේ යාමට පළමු, ගසේ මුල් විට්ටමට පාදය තබන්නේ ගසට වැඳ තෙරුවන් හා දෙවියන් සිහිපත් කිරීමෙනි.

ඒ විධියේ එහෙත් ඊට වඩා සශ්‍රීක බවක් හා ගැඹුරක් පෙන්වන චාරිත්‍ර හා යාතු කර්ම දිවයිනේ සශ්‍ය පලදාව හා බැඳී පවත්නේය.

සුදුසු භූමියක් සොයා ගැනීමෙහි සිට කමත් මඩුව දක්වා වී ගොවිතැනට සම්බන්ධ වන විවිධ අවස්ථාවන් පුණ්‍ය හෝරාවකින් ඇරඹෙන සම්ප්‍රදායික යාතු කර්මයනට හා ඇතැම්විට හුදු විනෝදස්වාදය ගෙනඑන උත්සවයකට තෝතැනි වී ඇත. ඒ හා සම්බන්ධයෙන් සිංහල හා ද්‍රවිඩ ජාතික ගොවි ජනතාව එකසේ පිළිපදින ආචීර්ණ කල්පිත වතාවත් අපමණය. ඉන් එකක් එකක් ගෙන ව්‍යස්ත වශයෙන් විග්‍රහ කිරීම අති දීර්ඝ ලිපියකින් ඉටු කළ යුතුව ඇති හෙයින් එම යාතු කර්මාදීන් පොදුවේ ගෙන විමසා බැලීම මෙම ලිපියෙහි අභිප්‍රායාර්ථය වන්නේය.

කුඹුරේ සෑම කාර්යයක්ම පංචාංග ලිතේ එන නැකැත් වේලාවන්ට අනුව ඇරඹීම සිංහල හා ද්‍රවිඩ ගොවීන්ගේ සිරිතය. පංචාංග ලිත බෞද්ධ-හින්දු කවීරුන් විසිනුත් එකසේ පරිශීලනය කරනු ලබන්නකි. සිංහල හා ද්‍රවිඩ අළුත් අවුරුදු චාරිත්‍ර පවා එකම ලිත් ක්‍රමයට සකස්වී ඇති බව බොහෝදෙනා දන්නා කාරණයකි. එතැන ජාතිභේදයක් නැත. ආගම් භේදයක් ද නැත. උස් මිටි භේද ද නොමැත්තේය.

නැකතට අනුව පුණ්‍ය හෝරාවක් දෛවඥයෙකු මාර්ගයෙන් තෝරා ගන්නා ගොවියා තෙරුවන් නැමද දෙවියනට පඬුරු පාක්කුඩම් පුද, ඇතැම්විට බිමේ සිව් කොනෙහි ආරක්‍ෂා යන්ත්‍රද වළලා මල් පැලක්ද තනා ගොවි කර්මාන්ත කටයුතු අරඹයි.

එම සිරිත් කවරේදැයි අත්දැකීමෙන් වටහා ගැනීම ඤාණාන්විත වුවද, එබඳු පාරම්පරික චාරීත්‍රයන් එකින් එක විස්තර කෙරෙන සේ පැබැඳුනු ගොයම්, නෙළුම් හා කමත් කවි රැසක්ම ශ්‍රැති සූචනයෙන් අවුත් ගැමි (ජන) කවි හැටියට ව්‍යවහාරයෙහි පවත්නා නිසාම එම කවි ද ආශ්‍රය කර ගැනීමෙන් ගොවිතැනට සම්බන්ධ කොට අනුගමනවන චාරිත්‍රවල යථාර්ථය බොහෝ දුරට අවබෝධ කර ගත හැකි වන්නේය. තරමක් දුරට හෝ ගොවියාගේ සාමාජික පසුබිමත්, ආර්ථිකයත් ඊටත් වඩා මානව විද්‍යාත්මක වශයෙන් එම යාතුකර්මයන්ගේ යථා ස්වරූපයත් අවබෝධ කර ගැනීමට වෙහෙසීමද ප්‍රතිඵල දායක මහඟු කාර්යයක් වෙතැයි සිතමි.

ගොයම් කපා පාගනු ලබන අවස්ථාවේදී ගායනා කෙරෙන ගොයම් ගීතවලින් ගොවිතැනේ ආරම්භයෙහි සිට අවසානය දක්වා පිළිපදින සිරිත් බෙහෙවින් අනාවරණය වන්නේය. එම ගීත නෙළුම් කවි හා කමත් කවි හැටියට ද හැඳින්වෙයි. ගොයම් මාලය, කමත් මාලය හා නෙළුම් මාලය යනුවෙන් වෙනම සකස්වූ කවි පොත්ද අතරින් පතර දිස්වෙතත් වැඩි වශයෙන් තම වැඩිහිටියන් මිහිරි හඬින් ගායනා කළ ගීත ශ්‍රැති සූචනයෙන් ඉහළ පරම්පරාව විසින්ද කට පාඩම් කර ගෙන තිබෙන හෙයින් මිනිස් සිතේ නිසර්ගයෙන් ධාරණය වූ කවි සිපද විමසීම වඩා ප්‍රයෝජනවත්ය.

ආචාර්ය ආනන්ද කුමාරස්වාමි රාජකීය ආසියාතික සමිතිය (ලංකා ශාඛා) සඟරාවකට කෘෂිකර්මය පිළිබඳ පැරණි සිරිත් විරිත් අළලා ලිපියක් සපයමින් එවැනි අප්‍රකට කවි පන්තියක්



(අස්වනු නෙලිමේදී පමණක් නොව වැපිරීමේදී ද පුද සිරිත් ඇත.)

ගැන විස්තරයක් ඉදිරිපත් කරයි. කමත් හැල්ල නම් වූ එම කවිපන්තිය රත්නපුර දිස්ත්‍රික්කයේ නිරි ඇල්ලේදී ඔහුට අසන්නට ලැබී තිබේ. එයින් රත්නරපුර දිස්ත්‍රික්කයට පමණක් සීමාවූ ව්‍රත චාරිත්‍ර හෙළි වන්නේ යැයි නොසිතුවමනාය. හතර කෝරළයේ කෑගලු ප්‍රදේශයේ ගොවි උත්සව අරභයා එච්. සී. පී. බෙල් 1889 එම සහරාවේ 11 වෙනි වෙළුමට සැපයූ ලිපියෙහිද එවැනිම සිරිත් පිළිබඳ විස්තර අඩංගු වන්නේය.

වී වැපිරීමෙහි සිට කපා පාගා ගැනීම දක්වා වූ විවිධ අවස්ථාවන්ට සම්බන්ධ කරගෙන ඉටු කෙරෙන පිළිවෙත් කමත් හැල්ලෙන් එළිදරව් වන්නේය.

“වී සහ බීජු වපුළ කල ට<br>
ගිරා නිල්ල වෙන තරම ට<br>
දිය බඳිමින් නිසි තරම ට<br>
හීන් බණ්ඩි වෙන ගොයම ට” යි

කමත් හැල්ලෙහි මුලින්ම සඳහන් වෙයි.

“දිය බඳිමින් නියර උස ට<br>
කිරි දී කිරි වදින කල ට<br>
කරල් නැමී නැගෙන ඉර ට<br>
ගොයම් පැසී තිබෙන කල ට”

යනාදි වශයෙන් නියර බැඳීම, ලියදි තැනීම කරල් බරවීම ආදි විවිධ අවස්ථාවන් ඔස්සේ ශස්‍ය වර්ධනය වන අයුරු ඉන් යස රහට හෙළි වන්නේය.

කමතේ බලය රඳා පවත්නේ විශේෂයෙන් තෙරුවන් හා ඉරු සඳු, දෙවියන් මතය. ද්‍රවිඩ ජාතිකයන්ගේ කමත බොහෝ පිල්ළෙයාර් නමින් හැඳින්වෙන ගණ දෙවියන්ද ඉන්ද්‍ර දෙවියන්ද සම්බන්ධ වත්පිළිවෙත්වලට කේන්ද්‍රස්ථානය වී ඇති සේ පෙනේ. ඉන්ද්‍ර වූකලී වලාකුළු, වැස්ස, ධාන්‍ය ආදියට අධිපති දෙවියායි, වැසි බිංදුව යන අරුත ද ‘ඉන්ද්‍ර’ යන්නෙහි යෙදේ. ජේ. පී. ලුයී මහතා 1884 දී, ද්‍රවිඩ ජනතාව අතර පවත්නා ගොවිකම් සිරිත් පිළිබඳව ලිපියක් රාජකීය ආසියාතික සමිතියේ ඉහත කී සහරාවේ 8 වෙනි වෙළුමට ‘සපයමින්’ පිල්ළෙයාර් හෙවත් ගණ දෙවියන්ට යාතිකාකොට ‘පොංගලයක්’ දීමේ සිරිත පැහැදිලි කරයි. වෙලේ වැඩ කරන ඒ ඒ අවස්ථාවලදී පිල්ළෙයාර් දෙවියන් වෙනුවෙන් පොල් ගසනු ලැබේ.

අන්වැන්න වැඩෙන අවස්ථාවලදී යන්ත්‍ර මන්ත්‍ර ආදිය කිරීමත් කජ් ජේ කිරීම් ආදියත් සිංහල ගොවියා අනුගමනය කරන තවත් කෙටි යාතු

කර්ම වන්නේය. ඒ ඒ උවදුරු සඳහා වෙන වෙනම මන්ත්‍ර ඇත. ගොයම් කපා පාගා ගන්නට කලින් ආරක්‍ෂාව සඳහා මැතුරූ පොල්, කමතෙහි වැළලීම සිරිතයි. බහිරවයගෙන් අනතුරු ඇති වන්නේ යැයි ගැමියෝ විශ්වාස කරන්නාහුය.

වී පැළ කාලයෙහි හදිසියේ මැලවී මැරී යන්නට පටන් ගතහොත් කට්ටාඩියකු ලවා පිදේනියක් නැත්නම් ගොටුවක් දැමීම සාමාන්‍ය සිරිතයි. එකී අවස්ථාවලදී විශේෂයෙන් නැගෙනහිර දිසාවෙන් කට්ටාඩියා කෙතට ඇතුල්වන බව පෙනේ, සියලු වස් දෙස් නැති කොට ගොටුව රැගෙන ඉවතට යන්නේ බටහිරෙනි. සූර්‍ය දිව්‍ය රාජයාගේ බලය පිළිබඳව ඇති විශ්වාසය එයින් තවදුරටත් කුළු ගැන්වෙයි. ද්‍රවිඩ ජනතාව නැගෙනහිර දිසාව බලා පිල්ලෙයාර් දෙවියන් උදෙසා පොල් ගසන බව කලින් පෙන්වා දුනිමි. එම ක්‍රියාවෙහිද ගැබ්වී ඇත්තේ සූර්ය දේව සංකල්පයයි.

මීයන්ගෙන් ධාන්‍ය වලට ඇතිවන උවදුරු නැති කිරීම සඳහා කෙටි යාතු කර්ම ප්‍රයෝජනයට ගන්නා බව පෙනීයයි. එවැනි අවස්ථාවලදී පස්මල් සහිත තටුවක් පහනක්ද දල්වා නූලක ගැට හතක් දමා එම නූල ජීවම් කිරීමේ පැරණි චාරිත්‍රය ගැන සඳහන් කරන කුමාරස්වාමි මහතා එහිදී භාවිතා කෙරෙන මන්ත්‍රයකින් කොටසක් මෙසේ සටහන් කර ඇත.

"ඕ ශ්‍රීං ශුත්තිලානන් මූසිකානන් කලහන්නේ නසාජන්තු: සුර ගුරුළු නමඃ........," 'මූසික යනු මීයාට නමි. එම වචනය 'මූසිල' යි යෙදෙන්නා සමාන ලෙස උසුර විය හැකි නිසා දෝයි සැක සිතේ. ශුත්තිල මූසිල සම්බන්ධයෙක්ද ඊටම අඩංගු කිරීමෙන් යන්ත්‍ර මන්ත්‍රවල බාහිර වශයෙන් කළ එකතුකිරීම්ද ඇති බව වැටහෙයි, එහෙත් යටකී උවදුරු පොළවට අරක්ගත් බහිරවයාගෙන් සිදු වෙතැයි පවත්නා පොදු විශ්වාසය මේ මන්ත්‍රපාඨයෙන් සාක්ෂාත් වන්නේය "ඕං හිරිං බහිරව වටුක ප්‍රලයන්තු නමං" යි මන්ත්‍රවල සඳහන් වන්නේ එබැවිනැයි සිතමි. එය වෙයන්ගෙන් ගොයමට සිදුවන උපද්‍රව දුරිභූත කිරීම සඳහා ජප කරන මන්ත්‍රයකින් කොටසකි. තවද බුදු සිරිතට සම්බන්ධ වන විවිධ පුද්ගලයන්ගේ නාමයන්ද ඇතුළත්වූ ඒ විධියේ මන්ත්‍ර රැසක්ම දක්නේය. "ඕං මහමුනි අංගුලිමාල තෙරුන් අණින් මෙහි ඇප කැප හැර ඕධූ ඕධූ නමඃ" යනු එක් මන්ත්‍රයක් වෙයි. ඒ තෙරුන්ගේ අණෙන්, ගොයමට උවදුරු කරන යක් පිසාචයන්ට, 'ඕධූ ඕධූ' යි කියන්නේ, දුව පිය' යන අරුතිණි.

ද්‍රවිඩ ජාතිකයෝද භූත උපද්‍රව දුරු කිරීම පිණිස එවැනි මන්ත්‍රම් ජප කරන්නාහුය. ඇස් වහ (කණ්ණූර්රු) කටවහ (නාවූර්රු) නැති කිරීම පිණිස සුදුහුණු ගෑ කළයක කළු තිත් සටහන් කොට යෂ්ටියක් මත මුනින් නමා, මන්ත්‍රම් කීම ඔවුන්ගේ සිරිතයි.

බොහෝ සෙයින් එවැනි චාරිත්‍ර උත්සවාකාරයෙන් හා විශාල ලෙස භාවිතා කරන්නේ ගොයම් කැපීමේදී හා කමතේදීය. ගොයම් කැපීමේදී ගයන ගීතයක් මෙහිදී දක්වනු රිසියෙමි.

"රැලින් රැලට යන මුව රැල වන්නේ
අතින් අතට ලියනා කැති ගන්නේ
ගොසින් රුවට කවි තාල කපන්නේ
ඉතින් අපට දෙස් නැත දෙවියන්නේ"

මෙහි විස්තර වන හැටියට ගොවිලියන් ගොයම් කපන්නේ මුව රැලක් ලෙස දැකැති රැගෙන බව පෙනේ. ගැමි කවියා තමන් අවට ගම්බද පරිසරයෙහි–වනපෙතෙහි - දක්නට ලැබෙන ස්වාභාවික වස්තූන් හා සිදුවීම් ආශ්‍රය කරගෙන එම අවස්ථාව වර්ණනා කළ බව ඉන් හැඟේ. එහෙත් එහි අග පාදය යෙදුවේ ඇයි? ඉන් මතුවන්නේ කිනම් අර්ථයක්ද? ගොයම් කරල් කැපීම දෙස් සහිත දෙයක්" වන්නේ කෙසේද? තවත් නෙළුම් ගීතයක මෙසේත් එයි.

"වරම් ගොයම් කැපුමට දෙවිඳුගෙන් වරම්" දෙවිඳුගෙන් අවසර ගෙන තම රැකියාව ඇරඹීමේ සිංහල සිරිත ගැන මෙනෙහි කරන විට යට කී වචනද ඊට සම්බන්ධ වූ සිරිතක් විස්තර කිරීමට යොදා ඇතැයි සිතීමටද පුළුවන. එහෙත් වෙනත් රටවල ගොවිතැන්වලට අදාල–විශේෂයෙන් ගොයම් කැපීමට සම්බන්ධ – සිරිත් ගැන මානව විද්‍යාඥයන් විසින් පළ කැරුණු මතයක් මෙහිදී විශේෂ සැලකිල්ලකින් පිරික්සීමට අදහස් කරමි. ජේ. ජී. ෆේසර්ගේ, 'ගෝල්ඩන් බෞ' (Golden bow) නැමති ප්‍රශස්ත ග්‍රන්ථයෙහි එම අදහස් සම්පිණ්ඩනය කර ඇත. ධාන්‍ය වර්ග වූ කලී

ජීවයෙන් යුත් වස්තුවකි. එනම් එහි ආත්මයක් ඇත. ඉපදීමක් ඇති කරවන ස්වභාවයක් එහි ගැබ් වන්නේය. ඇමරිකාවේ පිරූ හි හා යුරෝපයේ විවිධ රටවල පමණක් නොව නැගෙනහිර ඉන්දියානු දූපත්වල පවා වී අස්වැන්න මාතාවක් හැටියට සලකනු ලැබේ. 'රයිස් මදර්' (Rice mother) 'සාරාමාමා' (Saramama) 'වීට් මදර්' (Wheat mother) 'බාර්ලි මදර්' (Barley mother) යනු විසින් වී ඇතුළු බොහෝ ශස්‍යවර්ග මාතෘත්වයෙහි ලා සලකනු ලැබේ.

එබැවින් මාතෘ ලක්‍ෂණ ගැබ්වූ වී කරල කැපීම පාපකාරි ක්‍රියාවක් සේ සලකන ලද දැයි සැක කරන්නට ඉඩ ඇත. මිනිසකු ඉපදීම ආත්මය කරගත් වස්තුවක් මැරීම හා සමානව සැලකුවාදැයි සැක සිතේ. මිසරයේ 'නෙළුම් කවි' වූ කලී ශෝකී ස්වරයකින් ගැයෙන පද මාලාවකින් සමන්විතසේ පෙනේ. 'මා-නෙ-හු' හෙවත් 'මනේරූ' යනුවෙන් හැඳින්වෙන එම ශෝකී ගීත වලින් මූලික වශයෙන් ප්‍රකාශ වන්නේ මරණය හා මරණින් නැගිටීම ( ) පිළිබඳ අදහස බව ෆ්‍රේසර් ප්‍රකාශ කරයි. ග්‍රීක රටේද එවැනි ශෝකී ගීත කාණ්ඩ වශයෙන් දක්නේය. ඒවා මරණ ප්‍රාප්ත වන දෙවියා හා යළි ඉපදෙන දෙවියා වටා ගෙතී ඇත්තේය.

ඒ අදහස් සම්බන්ධ කරගතහොත් ලංකාවේ වුව වී කරල් කැපීම-ජීවයක් විනාශ කිරීමක් සේ සැලකුවේ දැයි සිතන්නට බොහෝ සෙයින් ඉඩ ඇත. 'අප අත වරද නැත.-දෙවියන්ගෙන් වරන් ගනිමු'යි ගොයම් කපන ලියන් විසින් ගායනා කෙරෙන්නේ එබැවින්ද? යි ප්‍රශ්න කරන්නට කාලය එළැඹී ඇත.

"දුම්බර කෙතට වැට බැඳලා රැකුම් බැලුම්
මාවැලි ගඟේ දිය බැඳලා කෙතට ගිලුම්
දුම්බර ලීයෝ කර උස්සා බලන බැලුම්
තුත්පත් රටාවකි දුම්බර කෙතේ නෙළුම්" යි

ගායනා කෙරෙන විට ඇතිවන නාදමාලාව කොතෙක් දුරට ශෝකී ගීත රාවයකට යොමු වන්නේද? නැතහොත් සතුට පවසන අවස්ථාවක් ඉන් ද්වනිත වන්නේදැයි සොයා බැලීම් ගැමි ගී පර්යේෂණ කරුවන්ට භාර කරුණකි.

ගොයම් කැපීම සඳහා කිල්ලට හසු නොවන පුද්ගලයන් යෙදීමත්, විශේෂ සැලකිල්ලකින් හා ගෞරව සම්ප්‍රයුක්ත බියකින් යුක්තව සෑම කට යුත්තක්ම ඉටු කිරීමත් විශේෂයෙන් පෙනී යන කාරණා දෙකකි,

ස්නානය කොට ශුද්ධ පවිත්‍ර වන ගොවියා -ඇතැම් විට ඒ සඳහා විශේෂ පුද්ගලයෙකු යොදා ගනු ලැබේ- පළමුවෙන් "රන් දෑකැත්තකින්" කරල් තුනක් පමණක් කැපීමෙන් එම කටයුත්ත ආරම්භ කිරීම පැරණි සිරිත බව එච්. සි. පී. බෙල්ගේ ලිපියකින් මනාව හෙළි වන්නේය, ඉන් අනතුරුව ඒවා වෙන වෙනම මිටිවලට බැඳ, එක් එක් මිටිය තුලට යකඩ පතුරක් දමා, දිවි කඳුරු කොලයක දවටා හිසෙහි තබා ගෙන පෙහරකින් සේ කමතට ගෙන යාමෙන් කැපීම ආරම්භ වන්නේය. ඉන් පසු කමත මැද වළක් හාරා යට කී මිට වළලනු ලැබේ. වලට උඩින් රවුන් ගලක් තැබීමද සිරිතය. එම ගල මුත්ත (මට්ටා) යි හැඳින්වෙයි සමහරවිට රන් තැඹිලි ගෙඩියක්ද ඒ මත තබන්නේය. කැට කඳු ගොඩ කිරීම ඇරඹෙන්නේ ඊට පසුවය.

ඒ අන්දමේ සිරිත් දිවයිනේ අනිකුත් පළාත් හිද අනුගමනය කෙරෙන බව පෙනී යන්නේය,

"නැකැත් බලා ගොයම් ලියා
කමතට නිසි බිමක් සොයා
නැකැත් බලා ගොයම් ලියා
කමත වටට වල් ඇදයා"

යනුවෙන් කුමාරස්වාමි මහතා උපුටා දක්වන කමත් ගීතයෙන් වැටහෙන්නේ රත්නපුර පළාතේද කමත් සෑදීම පූණ්‍ය චාරිත්‍රානුකූලව සිදු කෙරෙන බවයි.

ජේ. සි. ලුයි ප්‍රකාශ කරන හැටියට රයිගම් කෝරළයේද, කමත මැද රිටක් සිටුවා ඒ වටේ දූති ගොයියා ගෙන යනු ලැබේ. ඒ විධියට රිට සිටුවීමේ සිරිත වූ කලී ද්‍රවිඩ ප්‍රදේශයන්හි 'වේලායි ආල්' රූගෙන' කඩ්ඩෙ පෝල පොලික්කඩේ' හෙවත් කමත මැද ඇති රිට වටේ යාමට සමානය. ඇත්ත වශයෙන් සිහනෑ කෝරළයේ ගොවීහු අරක්වල සත් වරක් පැදකුණු කරන්නාහුය. ඌව පළාතේ අරක් වළවල් ගැන ජේම්ස් පාසන්ස් "ස්පෝලියා සෙයිලනිකා" ග්‍රන්ථයෙහි (5(9) 1908 පි 125) විස්තරයක් කරයි.

අරක්වළ වූකලී මතුරා වැළලූ ගලක් සහිත ආවාටයක් වන්නේය. ඒ වළමැද 'පුවක් ලියෙන් සාමාන්‍යයෙන් තැනූ ගොන් කණුවක් ඉදිකෙරේ. ඉන් පසු වළතුල විවිධ අරක්‍ෂා භාණ්ඩ තැන්

පත් කරනු ලැබේ. අරක් බෙල්ලෙක්, පුවක් ස්වල්පයක් ද, දැකැත්ත (සමහර විට දැකැති කැබැල්ලක්) වී කරලක්, කදුරු කොළයක් කොස් කොළයක්, මැණික් කැබැලි ස්වල්පයක් යනාදිය එම අරක් බඩු වෙයි,

පැගීමට පහසු වන ලෙස ගොයම් කොළ වටමළුවට අඩුක් කොට කමත මැද්දේ තැනූ එම අරක් වළ නිසා භූතෝපද්‍රව වැළකී යතැයි විස්වාස කෙරේ, කමත් හැල්ලෙහි යථෝක්ත අරක් වළට දමන ආරක්‍ෂා භාණ්ඩ විස්තර වන්නේ පහත දැක්වෙන ලෙසය.

''දවට පිළිල හරි කර ගෙන
දෙහි පිළිල හරි කර ගෙන
නුග පිළිල හරි කර ගෙන
බුලත් පිළිල හරි කර ගෙන
දෙඩම් පිළිල හරි කර ගෙන
ඉළුක් පිළිල හරි කර ගෙන
පිළිල හතම හරි කර ගෙන''
''අරක් බෙල්ල හරි කර ගෙන
රබ්බඩ ගෙඩි හතක් රැගෙන
කදුරු කොළද හරි කර ගෙන
වරකා ඇටයක්අර ගෙන''

එවැනි චතාවත් නිසා පලදාව වැඩි වෙතැයි ගැමියන් තුල දැඩි විශ්වාසයක් වන්නේය.

''ඉහල වෙලේ තියෙන බැතා
පහල වෙලේ තියෙන බැතා
අටුකොටුවල තියෙන බැතා
ඇද පුරවන් මේ කමතා'' යි
ඔවුහු ගයන්නාහුය.

ද්‍රවිඩ ජනතාව අරක් වළ වෙනුවට කමත මැද කවයක් ගසති. කමත කවාකාරය වටේට කොහොඹ කොළ එල්ලනු ලැබේ. කවය මැද පොලික්කමඩ හෙවත් රිට සිටවනු ලැබේ. එහි ඉහළ කොනේ කොහොඹ කොළ හා වී කරල් කීහිපයක් ගැට ගසා තබනවා ඇත. භූමියෙහි ගොම මිශ්‍ර වතුර ඉසිනු ලැබේ.

යට කී පරිදි එක්තරා සටහනක් කමත මැදට වන්නට ගැසීම කෑගල්ල දිස්ත්‍රික්කයේ සිරිතය, කැට කඳු ගොඩ කිරීමෙන් පසු කොලැට එකතු කිරීමට කලින් එම භූමියෙහි කරන සටහන වේලාපත්කඩයක ස්වරූපය දරන බව බෙල් මහතාගේ විස්තර සටහන් වලින් අනාවරණය වන්නේය. කැට කඳු ගොඩ කෙරෙන්නේ ඒ සටහන අනුවය.

කොළ මැඩවීමට ගොනුන් යොද ගන්නේ ඉන් ඉක්බිතිවය. ගොනුන්ගේ පසු පසින් යන්නෝ දැති ගොයියාගෙන් වට කඩති. කළවිට කීම ඉන් පසුව සිදු කෙරේ. පසුව මැඩුවන් හලා බායි.

ද්‍රවිඩ ජනතාව මේ අවස්ථාවේදී ගණ දෙවි රූපයක් ගොමවලින් තනා පැත්තකින් තබා ඒ ඉදිරිපිට පොල් ගැසීම කරන්නාහුය. එසේ කරන්නේ වී ටික එකතු කර ගන්නා කාලයෙහි පොලවට අරක්ගත් බහිරවයා වී ඇද ගනීවියැයි බියෙනි. ගණ දෙවියෝ ඔවුන්ට ආරක්‍ෂාව සලසති. තවද ඒ විධියට චතාවත් සම්පූර්ණ කළ හොත්, බහිරවයා බැත අඩු කරනවා වෙනුවට එහා කුඹුරේ වී කොළයෙන්ද කොටසක් මෙහා කුඹුරට ගෙනැවුත් දෙතැ යි සිංහල ගම්වැස්සෝ අද දක්වා විශ්වාස කරති. ළඟ ළග ඇති කමත් දෙකක එකම දිනයෙහි වී නොපාගන්නේ එම නිසාය. කමත බොහෝ සෙයින් ආරක්‍ෂා කිරීම ගොවියාගේ සිරිතය. හිස් භාජන ඒ තුලට රැගෙන ඒම තහනම් වෙයි. හදිසියෙන් යම් යම් දේ සිදුවීමටද ඉඩ නොතැබේ. කිසිම අමුත්තෙකුට ඒ අහලටවත් එන්නට ඉඩ තබන්නේද නැත. ඇයි දැයි විමසිය යුතුය. ඒ වූ කලී මානව විද්‍යාඥයන් විසින් විග්‍රහ කැරුනු දෙවියාගේ මරණය හා නැවත ඉපදීම යන සංකල්පයට සම්බන්ධ වූ චාරිත්‍රයක් දැයි සැක පහළ වෙයි. ප්‍රීජියාහි කෙතට එන අමුත්තා, ධාන්‍ය ආත්මයේ ප්‍රති මූර්තියක් හැටියට සලකනු ලැබේ. අස්වැන්න නෙලා ගන්නා විට ඒ ධාන්‍ය ආත්මය විනාශ කෙරේ. වී කරල කපන විටද සිදු වන්නේ එසේමය. එබැවින් යළිත් ධාන්‍ය ආත්මයේ ප්‍රතිමූර්තියක් මතුවීමට ඉඩ නොතැබීම එම විශ්වාසයෙහි එල්බගත් කෘෂිකාර්මිකයාගේ සිරිත වෙයි. ඇතැම් විට ප්‍රීජියාහි ගොවියෝ එසේ එන අමුත්තන්ගේ හිස ගසා ගහට විසි කිරීමට තරම් සාහසික වන්නාහුය. බැත ගැසීමෙන් පසු මැඩුවන් හලාබානු ලැබේ. ඉනික්බිති ගොඩ ගැසූනු වී මත්තේ අලු, දැති ගොයියාගේ හා ගොයි ලැල්ලෙන් ගලවා ගත් කොටස් කීපයක්, බෝලත්තක කොටසක් පිදුරුවල ඔතා අම්බරුවන්ගේ වලිගෙන් ගත්

මයිල් ගසක්ද ඊ මත්තේ දමා පොට්ටනි කොට බැත උඩ තැබීම කෑගල්ලේ පැරණි කමත් සිරිත බව පෙනි යයි. වී හුළං කරන විටද ඒ හා සමාන චාරිත්‍ර අනුගම්‍ය වන්නේය. පුණ්‍ය හෝරාවට 'යතුර' අතට ගන්නා ගොවියා හය වාරයක් වී ගොඩට නමස්කාර කොට හුළං කිරීම අරඹයි. හොඳ වී වෙන් කර ගත් විට බොල් පැත්තකට අස් කරනු ලැබේ. අහකට බෝල තියනවායි එම ක්‍රියාව හැඳින්වෙයි. පළමු වෙනි බැතකන්දේ ත්‍රී ශූලයක් ලකුණු කෙරේ. ද්‍රවිඩ සිරිතද එයයි. ඊළහට කිසිවෙක් කතා නොකරති. රාහියට හෙවත් වීගොඩට වදින ගොවියා ලඟ ගොයියා හෙවත් මනින භාජනයෙන් වී මැනීම අරඹයි. සමහරවිට වී ගොඩ කෙනෙකු විසින් බඳ ගැනීමද දක්නට ලැබෙන සිරිතකි.

මේ විධියට විවිධාකාර චාරිත්‍රවාරිත්‍රයන් සම්බන්ධ කරගෙන කමත් වැඩ සම්පූර්ණ කොට වී ගෙදරට ගෙනගිය විට ප්‍රථමයෙන් කෙරෙන්නේ පන්සලේ කොටස වෙන් කිරීමත් දෙවියන්ට කොටසක් තැබීමත්ය. අග්ග සස්සදන යි පෞරානිකයන් විසින් හඳුන්වනු ලැබුවේද එම බත යැයි සිතිය හැකි බව බද්දේගම විමලවංශ හිමියන්ගේ අදහසයි. පසුව එම බත දේවාලයට ගෙන යන ලදි.

පූර්වෝක්ත චාරිත්‍ර වූ කලී පැරන්නන්ගේ ප්‍රලාපය, මිථ්‍යාමත යැයි පසෙකට ලීම පහසු කටයුත්තකි. එහෙත් එම සිරිත් හේතු කොට ගෙන ගොවිතැනෙහි අගය වැඩි වන්නේය. ගොවි කර්මාන්තය පූජනීය කාර්යයක් ලෙස සැලකීමට බොහෝ දෙනා පුරුදු වන්නේය. නවීන උපකරණ යොදා ගත්තද යථෝක්ත ව්‍රත චාරිත්‍ර පිළිපදින ගොවියා ශික්ෂණයක් ලබන්නේය. තම කාර්යය නොපිරිහෙලා ඉටු කරන්නේය. වතාවත් වැරදුනහොත් ඵලදව අඩුවෙයි. දෙවියෝ කෝප වන්නාහුය. එවැනි ගෞරව සම්ප්‍රයුක්ත බීය ගොවිතැනට ඉතා හොඳයි.

(බක්මහ තිලිණය — ජනවේගය අනුග්‍රහයෙනි)